# 1.9 ශ්‍රී ලංකාවෙහි හින්දී අධ්‍යයන කටයුතු සඳහා සම්මත හින්දී ලේඛනය අනුගමනය කිරීමේ අවශ්‍යතාව

ලක්ෂ්මන් සෙනෙවිරත්න
හින්දි අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, කැලණිය.

---

## ABSTRACT

අප අසල්වැසි රට වන ඉන්දියාවෙහි රාජ්‍ය භාෂාව වන හින්දී භාෂාව හැදෑරීමට ශ්‍රී ලාංකිකයන් වඩාත් පෙළඹෙන ප්‍රවණතාවක් වර්තමානයෙහි දක්නට ලැබෙන අතර, ශ්‍රී ලංකාවෙහි පාසැල්, විශ්වවිද්‍යාල, ඉන්දියානු සංස්කෘතික මධ්‍යස්ථානය සහ වෙනත් පෞද්ගලික ආයතන කිහිපයක ම හින්දි භාෂාව ඉගැන්වීමේ කටයුතු සිදු කෙරේ. මෙම ආයතනයන්හි හින්දී ඉගැන්වීම් කටයුතු හා සම්බන්ධව කෙරුණු පර්යේෂණයක ප්‍රතිඵලයක් ලෙසින් ලේඛනය හා බැඳුණු විවිධතා සහ විෂමතා රාශියක් නිරීක්ෂණය කිරීමට හැකියාව ලැබිණි. මෙම තත්ත්වය ශ්‍රී ලංකාවෙහි හින්දී **අධ්‍යාපනය හා සම්බන්ධ එක් ගැටලුවක්** ලෙස ද හඳුන්වා දිය හැකිය. එම ගැටලුව පිළිබඳ ව සාකච්ඡා කර ඒ සඳහා විසඳුම් ඉදිරිපත් කිරීම මෙම පත්‍රිකාවෙහි අරමුණ වේ.

හින්දී ලේඛනය හා බැඳුණු විවිධතා සහ විෂමතා පහත දක්වෙන අවස්ථාවන්හි සිදුවන බව නිරීක්ෂණය වේ.

1. හින්දී වර්ණමාලාව සහ ශිරෝ රේඛාව භාවිතයේ දී
2. ව්‍යංජන සංයුක්ත කිරීමේ දී
3. ස්වර නාසිකීකෘතබව නිරූපණය කිරීමේ දී
4. අනුස්වාර සංකේතය භාවිතයේ දී
5. තාලන ශබ්ද භාවිතයේ දී
6. F& (ඊ)/ Ueer (යී) සහ S (ඒ)/ Ues (යේ) භාවිතයේ දී
7. පද, ප්‍රත්‍ය ලිවීමේ දී

ඉහත අවස්ථාවන්හි සිදුවන ලේඛන විෂමතා දුරු කර ගැනීමට ඉන්දියානු රජයේ ව්‍යවස්ථාපිත ආයතන මගින් සම්මත ලේඛන නීතිරීති පනවා ඇති නමුත් ශ්‍රී ලංකාවෙහි හින්දී ඉගැන්වීම් කටයුතුවල දී ඒවා පිළිබඳ නිවැරදි අවධානයක් යොමු නොකිරීම හේතුවෙන් මෙම ගැටලු සහගත තත්ත්වය නිර්මාණය වී ඇති බව මාගේ වැටහීමයි. එමනිසා ප්‍රස්තුත ගැටලුව පිළිබඳ සාකච්ඡා කිරීම, සම්මන්ත්‍රණ පැවැත්වීම සහ සම්මත හින්දී ලේඛන ව්‍යවහාරය පිළිබඳ දැනුවත් වීම ඉතා වැදගත් කාර්යයක් හා අවශ්‍යතාවක් බව පැවසිය යුතුය.

මෙම පත්‍රිකාව මගින් ඒ සඳහා අවස්ථාව සැලසෙන බවත්, හින්දී අක්ෂර වින්‍යාසය හා සම්බන්ධ සම්මත නීතිරීති පිළිබඳ දැනුවත් වීමෙන් ප්‍රස්තුත ගැටලුව නිරාකරණය කරගැනීමට හැකිවන බවත්, ශ්‍රී ලංකාවෙහි සිදු කෙරෙන හින්දී අධ්‍යාපනය හා බැඳුණු ලේඛන කටයුතුවල ඒකරූපීබවක් ඇතිවන බවත් නොඅනුමානය.